**ලංකා ධීවර සංස්ථාව - 2014**

---------------------------------

ලංකා ධීවර සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළු විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද
විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම, ශුද්ධ වත්කම්වලට අහිතකර ලෙස බලපෑම නිසා භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතාවය සඳහා සහන ලබාගැනීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සංස්ථාවේ අතිරික්ත කාර්ය මණ්ඩලයට මාස හයක කාලයක් රජයෙන් වැටුප් ගෙවීමට තීරණය කර තිබුණි. තවද සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය විමසා, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කොට විෂය භාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු බවටද අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07**

(i) සමාලෝචිත වර්ෂය තුළ මසුන් අලෙවිසැල් ස්ථාපනය කිරීම සඳහා මුදලින් දරනු ලැබූ රු. 4,705,413 ක් වූ වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල දක්වනවා වෙනුවට, ප්‍රවර්තන වර්ෂයට අදාල ක්‍රමක්ෂය ගැලපීම් කිරීමෙන් පසුව රු.3,164,389 ක් වූ ශුද්ධ අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑමක් ලෙස දක්වා තිබුණි.

(ii) විලම්භිත ආදායම් ලෙස නිවැරදි විය යුතු රු.24,914,759 ක් ක්‍රමක්ෂය මත ක්ෂයවීම් ලෙස සටහන් කර තිබුණි.

(iii) වර්ෂය තුල ප්‍රාග්ධන නොනිමි වැඩ වෙනුවෙන් මුදලින් දරනු ලැබූ වියදම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපුම් කරනු වෙනුවට පෙර වර්ෂයත්, ප්‍රවර්තන වර්ෂයත් අතර ප්‍රාග්ධන නොනිමි වැඩවල වෙනස වන රු.2,369,269 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ගැලපුම් කර තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18**

ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20**

රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37**

සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 07 ක් පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39**

මූල්‍ය වත්කම් සහ වගකීම් හඳුනාගැනීම හා මැනීම සඳහා වූ ගිණුම්කරණ ක්‍රමය හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සංස්ථාවේ විවිධ අලෙවි අංශයන් අතර පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ පදනම ඉකුත් වර්ෂය හා ඒකාකාරීව අනුගමනය කර නොතිබුණි. ඉකුත් වර්ෂයේ පිරිවැටුම පදනම් කරගෙන අලෙවි අංශ වලට පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ මසුන් අලෙවි අංශයට පමණක් පිරිවැටුමෙන් සියයට 3 ක් වන සේ පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කර තිබුණි. සංස්ථාව විසින් පොදුකාර්ය පිරිවැය අලෙවි අංශ අතර අන්තර්ග්‍රහණය කිරීමේ පිළිවෙත මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

**2.2.4 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ශේෂය රු.415,336 ක් වුවද බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී සාවද්‍ය ලෙස රු.825,336 ක් ලෙස දක්වා තිබුණි. ණයගැතියන්ගෙන් ලද සෘජු ලැබීම් රු.410,000 ක් ගිණුම්ගතකර නොමැති බව පසුව අනාවරණය විය.

**2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්**

මූල්‍ය ප්‍රකාශන අනුව මසුන් අලෙවි ණයගැතියන් හා ශීතාගාර ණයගැති ශේෂ, අදාල උප ලේඛනයන්හි දැක්වෙන ශේෂ සමග සැසඳීමේදී පිළිවෙලින් රු. 34,121,463 ක හා රු.718,755 ක වෙනසක් විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී සමස්ථ වෙළඳ ණයගැති ශේෂය රු.294,107,499 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 17 කින් වැඩිවී තිබුණි. මෙම ණය ශේෂ අතර අවුරුදු 05 ඉක්මවූ ණය ශේෂය රු.23,656,885 ක් විය. විශාල ලෙස ණය ශේෂ ඉහල යෑම හා දීර්ඝ

කාලීනව ණය ශේෂ පැවතීම තුලින් ණය පාලනයේ හා ණය අය කර කරගැනීමේ දුර්වල බව නිරීක්ෂණය විය.

(ආ) වෙළඳ ණයහිමි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා වූ ණයහිමි ශේෂය රු.16,885,327 ක් හා වර්ෂ 3 ට වැඩි ණයහිමි ශේෂය රු.28,052,788 ක් වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ලැබිය යුතු හිඟ කුලී ආදායම රු.105,668,736 ක් වූ අතර ඉන් වසරකට වඩා වැඩි පැරණි ණය ශේෂය රු.6,502,980 ක් විය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 177 | යොමුගත රෙගුලාසිය අනුව එකතුකර ගන්නා රජයේ මුදල් දෛනිකව ප්‍රේෂණය කළ යුතු වුවද එකතුව රු.170,870 ක් වූ ආදායම දින 2 සිට දින 10 දක්වා කාල පරාසයක් ප්‍රමාදව බැංකුගත කර තිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය | චක්‍රලේඛයේ උපදෙස් වලට පටහැනිව සංස්ථාවට අයත් නොවන වාහන තුනක් වෙනුවෙන් රු.316,000 ක ඉන්ධන වියදම් දරා තිබුණි. |
| (ඇ) | 2013 ජනවාරි 15 දිනැති අංක 1/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිරව හා චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අවුරුදු 71 ඉක්මවූ නිලධාරියෙකු ජ්‍යොෂ්ඨ උපදේශක තනතුරක් සඳහා 2013 මාර්තු 15 දින සිට රු.50,000 ක මාසික දීමනාවකට බඳවාගෙන තිබුණි. 2013 මාර්තු 15 දින සිට 2014 දෙසැම්බර් 31 දක්වා දීමනා ලෙස රු.1,150,000 ක් හා ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස 2013 මාර්තු සිට 2014 දෙසැම්බර් දක්වා එකතුව රු. 2,338,626 ක් ගෙවා තිබුණි. |

**3 . මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.119,187,790 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.54,446,218 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.64,741,572 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. විකුණුම් ආදායම් රු.853,293,687 කින් වැඩිවී භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.47,395,965 ක් ලැබී තිබුණද විකුණුම් පිරිවැය රු.947,392,426 කින් වැඩිවීම හා ක්‍රියාකාරී නොවන ආදායම් රු.16,729,938 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ 6 ක් තුල ලබා ඇති ශුද්ධ අලාභය රු.මිලියන 384 ක් වූ අතර ,සමාලෝචිත වර්ෂය අවසානයේදී ශුද්ධ අලාභය රු.මිලියන 119 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශුද්ධ අලාභය සියයට 120 කින් වැඩිවී තිබුණි.

(ආ) සංස්ථාවේ ජංගම අනුපාතය 0.76:1 ක් හා ක්ෂණික අනුපාතය 0.64:1 ක් වීම හේතුවෙන් සංස්ථාව උග්‍ර කාරක ප්‍රාග්ධන අර්බුදයකට මුහුණ දී ඇති බව නිරීක්ෂණය විය .

(ඇ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මසුන්, අයිස්, ශීතාගාර හා ටින්කල මසුන් යන අංශයන්හි දළ ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පහත පරිදි විය.

| විස්තරය | දළ ලාභ ආන්තිකය | | ශුද්ධ ලාභ ආන්තිකය | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 |
| | සියයට | සියයට | සියයට | සියයට |
| මසුන් ආදායම | 22.2 | 45 | 2.1 | (1.3) |
| අයිස් ආදායම | 130 | 294 | (84.6) | (12.6) |
| ශීතාගාර ආදායම | 2,733 | 2,882 | (22.5) | (34.7) |
| ටින්කල මසුන් ආදායම | 4.5 | 1.6 | 45.2 | (3.5) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මසුන් ආදායමේ සහ ශීතාගාර ආදායමේ දළ ලාභ ආන්තිකය අඩුවීම සඳහා විකුණුම් පිරිවැය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ii) අයිස් යන්ත්‍රාගාර ක්‍රියාවිරහිත වීම හේතුවෙන් අයිස් නිෂ්පාදනය අඩුවීම, අයිස් ආදායමෙහි දල ලාභ හා ශුද්ධ ලාභ ආන්තිකය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අලෙවි අංශයන්හි වියදම් වල පහත දක්වා ඇති අසාමාන්‍ය වැඩිවීම් හා අඩුවීම් නිරීක්ෂණය විය.

(i) ටින්කල මසුන් අංශයේ අලෙවි වියදම් , මූල්‍ය හා වෙනත් වියදම් පිළිවෙලින් සියයට 91.4 ක්, සියයට 99.6 කින් හා සියයට 99.78 කින් අඩුවී තිබුණද, පරිපාලන වියදම් සියයට 174.56 කින් වැඩිවී තිබූ අතර එය ඒකසේවක පිරිවැය වැඩිවීමට බලපා තිබුණි.

(ii) ශීතාගාර අංශයේ මූල්‍ය වියදම් සියයට 73 කින් වැඩිවී තිබුණු අතර එයට ණයපොලී වැඩිවීම බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

ඉකුත් වසර තුන තුල මසුන් අලෙවි ප්‍රමාණය හා අයිස් අලෙවි ප්‍රමාණය අඩුවී තිබූ අතර පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මසුන් හා අයිස් අලෙවි ප්‍රමාණ පිළිවෙලින් මෙට්‍රික් ටොන් 677 කින් හා මෙට්‍රික් ටොන් 16,384 කින් අඩුවී තිබුණි. අයිස් අලෙවි ආදායමේ අඩුවීම රු.මිලියන 71 කි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී හඳුනාගත් අපහරණය කළ යුතු එකතුව රු.5,202,867 ක් වූ වත්කම් අපහරණය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි.

(ආ) සංස්ථාව සතු රු.66,715,516 ක් වටිනා බහුදින ධීවර යාත්‍රා දෙකක් 2010 ජනවාරි 20 දින සිට මාසිකව රු.200,000 ක බදු කුලියකට වසර 2 ක් සඳහා පුද්ගලික ආයතනයකට බදු දී තිබුණද, අදාල ගිවිසුම අත්සන් කර තිබුණේ මාස 06 ක් ප්‍රමාදවී 2010 ජූලි 30 දිනදීය. යාත්‍රා 02 සඳහා 2011 ජනවාරි සිට 2013 නොවැම්බර් දක්වා හිඟ බදු කුලිය රු.6,000,000 ක් අය කරගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ නීතිමය කටයුතු මන්දගාමී තත්ත්වයේ පැවතුණි.

ඉහත සඳහන් යාත්‍රා දෙක අතරින් එක් යාත්‍රාවක් සමාලෝචිත වර්ෂය තුළදී තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව නැවතත් බදු දී තිබූ අතර ඊට අදාල ආරක්ෂක තැන්පතු ද ලබාගෙන නොතිබුණි. තවද ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම රු.33,324,776 ක් වටිනා බහුදින ධීවර යාත්‍රාව බදු ගැණුම්කරු සතු කර තිබුණු අතර, 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා යාත්‍රාවට අදාල රු.1,125,000 ක බදු මුදල් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් භුක්ති විඳින අක්කර 09 පර්චස් 15.59 ක් වූ ඉඩම් 08 ක්, වසර 31 ක් තිස්සේ අදාල පාර්ශවයන් වෙතින් නීත්‍යානුකූලව පවරාගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) ධීවර සංස්ථාවේ සභාපති අමතන ලද 2013 මාර්තු 06 දිනැති අංක එන්පීසී/1/2/6 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වැඩසටහන් උපදේශකගේ ලිපිය අනුව ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 15 ක් වූ ත්‍රිකුණාමලය මසුන් අලෙවිසැල 2013 මාර්තු 09 දින සිට සංස්ථාව වෙත පවරාගන්නා ලෙස දන්වා තිබුණද, 2016 ජනවාරි දක්වා පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ආරම්භ කරන ලද උම්බලකඩ ව්‍යාපෘතිය 2014 වර්ෂය තුළදී අලාභ ලැබීම හේතුවෙන් වර්ෂය අවසාන වනවිට රු.3,638,311 ක අලාභයක් ලබා තිබුණි. රජය ආනයන තීරුබදු අඩුකිරීම නිසා වෙළඳපල මිල පහළ යාමෙන් මෙම තත්ත්වය ඇති වූ බවත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ව්‍යාපෘතිය නතර කර දමා ඇති බවත් සභාපති විසින් විගණනය වෙත දන්වා ඇත.

(ආ) යුරෝපා සංගමය විසින් පනවා ඇති තහනම ඉවත් කරන තුරු ධීවරයන්ගේ අතිරික්ත මත්ස්‍ය අස්වනු මිලදී ගැනීම සඳහා 2014 දෙසැම්බර් 17 දින භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබූ ටූනා ව්‍යාපෘතියේ අපේක්ෂිත මිලගණන් වලින් බැහැරව උප සභාපතිගේ අනුමැතිය මත මාළු තොග මිලදී ගැනීම් හා විකිණීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.47,359,695 ක අලාභයක් ලබා තිබුණි.

(ඇ) මාළු අලෙවිය සිදුකරන විධායක 32 අතරින් 28 ක් අලාභ ලබා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ ලබා තිබුණු මුළු අලාභය රු.180,538,573 ක් විය.

**4.4 දෘශ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මසුන් අලෙවිසැල් සඳහා බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමේදී සෘජුවම කුලීහිමියා වෙත නොගෙවා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අලෙවි කළමනාකරුවෙකු වෙත මුදල් චෙක්පත් නිකුත් කර තිබුණි. ඔහු විසින් කුලී ගෙවීමෙන් තොරව ව්‍යාජ බිල්පත් සංස්ථාව වෙත ඉදිරිපත් කර 2013 හා 2014 වර්ෂවල දී රු. 2,260,000 ක් වංචනික ලෙස ලබාගෙන තිබුණි.

(ආ) 2011 වර්ෂය තුළදී සිදුවූ වංචාවක් නිසා රු.2,558,029 ක කාඩ්බෝඩ් තොග ඌනතාවය, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු යුතු ශේෂ යටතේ දක්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හදුනාගෙන මුදල් රෙගුලාසි 103 හා 104 අනුව විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ එය අයකරගැනීමට හෝ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සංස්ථාවේ අංශ 05 ක මසුන් වෙළඳ තොගවල මෙට්‍රික් ටොන් 915 ක ඌනතාවයක් පැවති අතර, එම ඌනතාවයන් සම්බන්ධයෙන් කළමනාකරණයෙහි අවධානය යොමුවී නොතිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට අයත් බැංකු ගිණුම් 07 ක එකතුව රු.121,979 ක ශේෂය අක්‍රියව පැවතුණි.

**4.6 හදුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්බදු මුදල් නියමිත දිනට නොගෙවීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේදී රු.67,771 ක දඩ ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් බැංකු අයිරා පොළී ලෙස රු.15,286,528 ක් ගෙවා තිබූ අතර ඉන් ක්‍රියාකාරී අංශය සඳහා පමණක් රු.5,403,488 ක අයිරා පොළියක් විය.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 745 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 1,228 ක් වුයෙන් 483 ක සේවක අතිරික්තයක් පැවතුණි. අවශ්‍යතාවය නිශ්චිතව හදුනා නොගෙන අතිරේක සේවකයන් බඳවාගැනීම නිසා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංස්ථාව විසින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව පාඩු ලැබීමට සාධාරණ හේතු දැක්වීම් සහිතව එම පාඩු තුලනය කරන ආකාරය සහ නැවත පාඩු වැලැක්වීමට ගන්නා ක්‍රියාමාර්ග සහිතව මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද ආයතනය විසින් වසර ගණනාවක සිට පාඩු ලබමින් පැවති නමුත් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු

කර නොතිබුණි. සංයුක්ත සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණ බැවින් සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ ඉලක්ක සපුරාගැනීමට නොහැකි වී තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 33 සිට සියයට 840 ක් දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 සහ 2012 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග ඉටුකර නොතිබුණි**.**

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතුව රු.83,384,863 ක් වූ ආර්ථික සේවා ගාස්තුව හා බදු ගෙවීම.

(ආ) පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරයෙහි ආයෝජනය කර ඇති ඉඩමේ අයිතිය නැවත ලබාගැනීම.

(ඇ) හිඟ ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර රු.මිලියන 299.5 ක් වූ ශේෂ සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 399.7 දක්වා වැඩිවී තිබීම.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) මසුන් මිලදී ගැනීම හා අලෙවි කිරීම
(ආ) ගෙවීම් පාලනය
(ඇ) ආදායම රැස්කිරීම
(ඈ) ගිණුම්කරණය
(ඉ) ස්ථාවර වත්කම් පාලනය
(ඊ) කාර්ය මණ්ඩල පාලනය
(උ) අයවැය පාලනය
(ඌ) ණයහිමි හා ණයගැති පාලනය